# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/48 - 2017 ජුනි මස 02 වැනි සිකුරාදා - 2017.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/13/29/2008

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.10.07 දිනැති හා අංක 1987/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.10.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අහංගම, කතළුව, ගුරුකන්ද, ''විකුම්සිරි'' හි පදිංචි ආනන්ද හේවාගම මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් ගාල්ල, පහළ ඩික්සන් පාර, නො. 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.02.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් (වැඩ බලන).

2017 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංක : IR/13/29/2008

කාර්මික අධිකරණයේ දී ය.

ආනන්ද හේවාගම මහතා,
''විකුම්සිරි'', ගුරුකන්ද,
කතළුව, අහංගම.

*එක් පාර්ශ්වයක් වශයෙන්*

නඩු අංකය ඃ ඒ 3668 සහ

දකුණු පළාත් මාර්ග සංවර්ධන
අධිකාරිය, අංක 19,
පහළ ඩික්සන් පාර, ගාල්ල.

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි.

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වෙලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන ඔහු 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2016.10.05 වන දින බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ, ''දැනට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්තව ඉංජිනේරුවරයෙකු වශයෙන් සේවය කරන ආනන්ද හේවාගම මහතා විසින් එම අධිකාරිය වෙතින් කරන පහත සඳහන් ඉල්ලීම් යුක්ති සහගත ද යන්න හා යුක්ති සහගත නොවේ නම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

01. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 1995.02.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 04 ක් සහිතව ඉංජිනේරු III ශ්‍රේණියට උසස් කළ යුතු බව.

02. 1996.11.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු II ශ්‍රේණියට උසස් කර, ඒ අනුව හිඟ වැටුප් ලබාදීම කළ යුතු බව.''

*පෙනී සිටීම ඃ*

*පළමු පාර්ශ්වය ඃ*

ආනන්ද හේවාගම මහතා පැමිණ ඇත. ඔහු වෙනුවෙන් නියෝජනයක් නැත.


1 A – G 25664 — 28 (2017/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*දෙවන පාර්ශ්වය :*

නීතිඥ කපිල මනම්පේරි මහතා පෙනී සිටී.

පාර්ශ්වකරුවන් දෙදෙනාම විධිමත් අයුරින් පළමු හා දෙවැනි ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව පාර්ශ්වකරුවන් දෙදෙනාම ලිඛිත දේශන ඉදිරිපත් කරන ලදී. පාර්ශ්වකරුවන්ගේ ලිඛිත දේශන පරීක්ෂා කරන අවස්ථාවේදී, දෙවන පාර්ශ්වකරුගේ කරුණු අනුව යොමුව වැරදි බව පෙනී ගිය නිසා ප්‍රදානයට තුඩුදුන් හේතුව විසඳන්නට එළඹෙමි. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 67/98 (F/R) දරන නඩුවේ තීන්දුව (ප්‍රදානය අවසානයේ අමුණා ඇත.) අනුව පළමුවන පාර්ශ්වකරුට මෙම නඩුව ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි බවට දෙවන පාර්ශ්වය විසින් විරෝධතා ඉදිරිපත් කර ඇත.

මේ නඩුවට අදාළ යොමුව ඉහත සඳහන් කරුණු 02 කම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 67/98 (F/R) දරන තීන්දුවට අනුකූලව එකම කරුණු බවද සැලකිය යුතු ය. ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකරුවන්ගේ පළමුවන ප්‍රකාශයේ මෙසේ සඳහන් කර ඇත. එයින් අදාළ කොටස කෙරෙහි මා එකඟ වන හෙයින් එය පහත අයුරින් දක්වා ඇත.

ඉහත කී නෛතික තත්වය අනුව ඉල්ලුම්කරු විසින්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක 67/98(F/R) මගින් තහවුරු කරන ලද අතර එකී නඩුවේ තීරණය වසන් කරමින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා නොමග යවමින් වගඋත්තරකාර අධිකාරියට එරෙහිව සිය වාසියට තීන්දුවක් ලබාගැනීමේ උපක්‍රමයක ඉල්ලුම්කරු යෙදී සිටින බව දෙවන පාර්ශ්වය විරෝධතා පෙන්වා දෙනු ලැබේ. එකී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 67/98(F/R) දරන නඩුවේ සත්‍ය පිටපතක් ''ව-16'' ලෙස සලකුණු කර මෙහි අත්‍යවශ්‍ය අංගයක් ලෙස ඉදිරිපත් කර සිටී.

එකී ''ව-16'' දරන නඩු තීන්දුව ප්‍රකාරව පහත සඳහන් නිගමයන්ට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එළඹී ඇත.

(අ) ''... There is nothing to indicate that he joined the Southern Public Service with any link to either the Road Development Authority of the Central Government or the Sabaragamuwa Provincial Public Service and any event, the two Provincial councils have no link and are independent of each other. The petitioner cannot therefore claim that he is entitled to be appointed to Grade 3 by virtue of his service either in the Provincial Public Service or in the Road Development Authority of the central Government....''(පෙත්සම්කරු එනම් මෙම අයැදීමේ ඉල්ලුම්කරු මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවය යන ආයතන වලට කිසිදු බැඳීමකින් හෝ සම්බන්ධවීමකින් තොරව දකුණු පළාත් රාජ්‍ය සේවයට බැඳී ඇති බවත්, එකී පළාත් සභා දෙක කිසිදු සම්බන්ධයක් නොමැති එකිනෙකට ස්වාධීන වූ ආයතන 02 ක් බවත්, ඒ අනුව ඉල්ලුම්කරුට එකී මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවා කාලය මත III වන ශ්‍රේණියේ නිලධාරියෙකු බවට පත්වීමේ හැකියාවක් නොමැති බවත්)

(ආ) ''..... His nexus with the Southern Provincial Public Service continued until he was to released and was formally appointed as an Engineer Grade 4 by the Southern Provincial Road Development Authority, established by the southern Province Provincial Road Development Authority Statue No 4 of 1992..... ''

(දකුණු පළාත් රාජ්‍ය සේවය කෙරෙහි ඇති බැඳීම් ඔහු එයින් නිදහස් කරන තෙක් පැවති අතර ඉන් පසුව ඔහු 1992 අංක 4 දරන දකුණු පළාත් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය ප්‍රකාරව 4 වන ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙකු වශයෙන් පත් කරන ලද බවත්,)

''.... The Petitioner thus became a ''new employee'' of the Southern Provincial Road Development Authority.... ''
(පෙත්සම්කරු එනම් මෙහි ඉල්ලුම්කරු වගඋත්තරකාර අධිකාරියේ නව සේවකයෙකු බවට පත්වී ඇති බවත්.)

ඉහත කරුණු අනුව විශේෂයෙන්ම ''ව-16'' එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ අංක 67/98(F/R) දරන මානව හිමිකම් නඩුවෙහි තීරණය සැලකූවිට පැමිණිලිකරු විසින් සිය පැමිණිලිපත සමග ඉදිරිපත් කර ඇති ලේඛන අභිබවමින් එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව බලාත්මක වන බැවින් පැමිණිලිකරු විසින් අමුණුම 1 සිට ඇමුණුම 26 දක්වා ඉදිරිපත් කර ඇති ලේඛන වල අන්තර්ගතය සළකා බැලීම හෝ අර්ථනිරූපනය කිරීම නිශ්ඵල කටයුත්තක් බව කියා සිටී.

මෙම නෛතික තත්වයන් වසන් කරමින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ කරන ලද ඊනියා අයැදුම් එනයින්ම ප්‍රතික්ෂේප විය යුතු බව වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් පෙන්වා දෙනු ලැබේ.

මෙම දෙවන පාර්ශ්වකාර වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් මෙම ගරු බේරුම්කරණය වෙත ගෞරව පෙරදැරිව පෙන්වාදෙනු ලබන්නේ ''ව-09'' ලිපිය ප්‍රකාරව පැමිණිලිකාර පළමු පාර්ශ්වය වගඋත්තරකාර අධිකාරියේ සේවකයෙකු බවට පත්වන්නේ 1995.02.14 වන දින සිට අධිකාරියේ පාලනයෙන් බැහැර වූ වෙනත් ස්වාධීන ආයතනවල හා හෝ අධිකාරි වල බවත්, එකී ආයතන හා/හෝ අධිකාරිවල සේවා තත්වයන් හෝ එම ස්වාධීන ආයතනවල හා/හෝ අධිකාරි වල සේවා කාලසීමාවන් පිළිබඳව වගකීමක් මෙම දෙවන පාර්ශ්වකාර වගඋත්තරකාර අධිකාරියට නොමැති බවත් ගෞරවයෙන් සැළකර සිටී.

ඉහත කරුණු අනුව විශේෂයෙන්ම ''ව-16'' එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ අංක 67/98(F/R) දරන මානව හිමිකම් නඩුවෙහි තීරණය සැලකූවිට පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මුල් පැමිණිල්ල සහ ඔහුගේ මුල් ප්‍රකාශයද, මගින් ඉල්ලා සිටින සහන නැතහොත් කාරණය පිළිබඳව දැනටමත් එකී ශ්‍රේෂ්ඨාධිකාරණ නඩු තීන්දුව මගින් අවසානාත්මක වශයෙන් තීරණය කර අවසන්ව ඇති බව ගෞරව පෙරදැරිව සැළකර සිටී.

දැන් මෙම ගරු බේරුම්කරණය ඉදිරියෙහි ඇති ප්‍රශ්නය වී ඇත්තේ එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ අංක 67/98(F/R) දරන මානව හිමිකම් නඩුවෙහි තීරණය මගින් අවසානාත්මක වශයෙන් තීරණය කර අවසන්ව ඇති එහෙත් නැවත වරක් එම කරුණු මත පදනම්ව මෙම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධව ඉහත සඳහන් කර ඇති යොමුව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තීරණය කරන ලද තීන්දුවට ඉහළින් මෙම නඩුව නැවතත් පවත්වාගෙන යෑමට ඉඩ නැත.

මෙම දෙවන පාර්ශ්වකාර වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් මෙම ගරු බේරුම්කරණය වෙත ගෞරව පෙරදැරිව පෙන්වාදෙනු ලබන්නේ එසේ එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ අංක 67/98(F/R) දරන

මානව හිමිකම් නඩුවෙහි තීරණය මගින් අවසානාත්මක වශයෙන් තීරණය කර අවසන්ව ඇති ඉහත ඡේදයේ කී කාරණාව සම්බන්ධයෙන් වැඩිදුර යම් පරීක්ෂණයක් පවත්වා යම් තීරණයක් කිරීමේ බලය සහ අධිකාරය මෙන්ම එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවෙහි තීරණය අභිබවා යම් තීරණයක් කිරීමේ බලය සහ අධිකාරයද මෙම ගරු බේරුම්කරණය වෙත හිමි නොවන බවයි.

එහෙත් පැමිණිලිකාර පළමු පාර්ශ්වය, සිය පළමු ප්‍රකාශයෙහි ආයාචනයෙහි විකල්ප සහන වශයෙන් එකී මුල් සහන නැතහොත් මුඛ්‍ය සහනවලට පරිබාහිර සහන සහ නව සහන වන,

(අ) සිය පළමු ප්‍රකාශයෙහි 29 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි වැටුප් වර්ධක 05 ක් ලබාදී ඇති බැවින්, අමතර වැටුප් වර්ධක 01 ක් ද සමග 1995.02.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු III වන ශ්‍රේණියට උසස්කරන ලෙසටත් සහ 2000.02.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු II(II) වන ශ්‍රේණියට හිඟ වැටුප් ද සහිතව උසස්කරන ලෙසටත්,

(ආ) ඉහත (අ) ඡේදයෙහි සඳහන් ඉල්ලීම ලබාදිය නොහැකිනම් සිය පළමු ප්‍රකාශයෙහි 30 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි 1999.02.14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු III වන ශ්‍රේණියට උසස්කරන ලෙසටත් සහ 2005.02.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු II(ii) වන ශ්‍රේණියට උසස්කරන ලෙසටත්, ඒ අනුව ලැබිය යුතු සියළුම හිඟ වැටුප් ලබාදෙන ලෙසටත් ය.

ඉහත කරුණු අනුව විශේෂයෙන්ම එකී ''ව-16'' එකී ගරු ශ්‍රේෂ්ඨාධිකරණ අංක 67/98(F/R) දරන මානව හිමිකම් නඩුවෙහි තීරණය සැලකූවිට පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මුල් පැමිණිල්ල සහ ඔහුගේ මුල් ප්‍රකාශය සමග ඉදිරිපත් කර ඇති ලේඛන සහ ඒවායෙහි සඳහන් කරුණු අභිබවමින් එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව බලාත්මක වන බැවින් පැමිණිලිකාර පළමු පාර්ශ්වකරු විසින් එසේ ඉදිරිපත් කරන කරුණුවල අන්තර්ගතය සළකා බැලීම හෝ අර්ථනිරූපනය කිරීම නිශ්ඵල කටයුත්තක් බව ගෞරව පෙරදැරිව සැළකර සිටියි.

ඉහත සියළු කරුණු මත එකී වැදගත් නෛතික තත්වයන් වසන් කරමින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ කරන ලද ඊනියා අයැදුම එනයින්ම සහ මුල් අවස්ථාවේදීම කුසලතා නොසලකා ප්‍රතික්ෂේප විය යුතු බව දෙවන පාර්ශ්වකාර වග උත්තරකාර අධිකාරිය වෙනුවෙන් ගෞරවපූර්වකව සැළකර සිටී.

ඉහත දෙවන පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරන කරුණු සියල්ලම මා පිළිගනිමි.

මේ නඩුවට අදාළ යොමුවට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව 67/98(F/R) නඩුව යම්කිසි කෙනෙක් ඕනෑකමින් පැහැදිලිව පරීක්ෂා කරන්නේ නම් ඔහුට හෝ ඇයට නඩු නිමිති දෙකම එක සමාන බව පෙනී යයි. ඒ අතරින් බලනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට කවුරු හෝ යමෙක් ගරු කළ යුතු බව සැමදෙනාම දන්නා කරුණකි.

විනිසුරු වන ස්මයිල් මහතා විසඳිය යුතු කරුණු සම්බන්ධව ඉතා පැහැදිලිව ඔහුගේ තීන්දුවේ ප්‍රකාශ කරන ලදී. ඒ තීන්දුවේ කොටසක් දෙවැනි පාර්ශ්වකරුවන් පළමු සහ දෙවැනි ප්‍රකාශයේ දූනට උපුටා ඇත. එම තීන්දුවේ පළමු පාර්ශ්වකරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉල්ලුම්පත්‍ර තුනක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, 1996.09.24 වන දින SC අංක 646/96 පළමු පාර්ශ්වකරුවන්ගේ තුන්වැනි ශ්‍රේණියේ උසස්වීම සම්බන්ධවයි. එය පැමිණෙමින් පවතින බව පවසා ඇත.

එසේම SC ඉල්ලුම්පත්‍ර අංක 67/98(F/R) නඩුවේ තීන්දුවට එකඟවන පරිදි වෙනත් නඩු අංකයක් වන 1998.03.03 වන දින SC අංක 129/98(F/R) නඩුවද පළමුවැනි පාර්ශ්වය යක්කලමුල්ල, ගල්හිටිය පාරේ ව්‍යාපෘතියට මාරු කරවීම අසාධාරණ සහ නීතියට එරෙහිව කරන ලද හේතුව මත අවලංගු කළයුතු බව ප්‍රකාශ කර දෙන ලෙස කළ ඉල්ලීම ඉදිරියට ගෙනයාම නොකර SC අංක 67/98(F/R) නඩුවට දෙන ලද තීන්දුවට එකඟවෙන බව පවසා ඇත.

''Until the Petitioner was formally released he was an officer of the Southern Provincial Council attached to the Southern Provincial Road Development Authority. His nexus with the Southern Provincial Public Service Continued until he was so released and was formally appointed as an Engineer Grade 4 by the Southern Provincial Road Development, Authority, established by the Southern Province Provincial Road Development Authority Statute No. 04 of 1992. This statute is inconsistent with the Road Development Authority Act No. 73 of 1981 and therefore, that Act Stands Suspended and in inoperative in the Southern Province by virtue of the Provisions of Article 154 (G) (8) of the Constitution. The Petitioner thus became a ''new employee'' of the Southern Province Provincia Road Development Authority. The Provisions of section 15 (3) of the Southern Province Provincial Road Development Authority Statute are not Applicable to him as has been claimed. In making this appointment the 1st Respondent Authoriy was not bound to take the previous service record of the employee into consideration. The Petitioner has thus Failed to establish that the 1st Respondent Authority was under legal duty to appoint the Petitioner as an Engineer in Grade 3 or in Grade 2 (II). The Petitioner cannot therefore Succeed in this application.

Learned Counsel for the 3 rd to 6 th Respondents has also taken up the objection that this application is time - barred. The Petitioner's grievance is that decision contained in P 17 dated 06.11.1997 appointing him to Grade 4 on probation for a period of three years and the subsequent decision containded in P 25 dated 06.01.1998 to handover his duties to another officer are in violation of Article 12 (1) of the Constitution. It was submitted that the petitioner should have invoked the jurisdiction of this Court within one month from 06.11.1997 in terms of Article 126 (2) of the Constitution. He has instead sought administrative relief which was refused by letter dated 31.12.1997 (P21). As this application dated 03.01.1998 has been filed on 03.02.1998, the Submission that this application is out of time as the pursuit of other remedies does not prevent or interrupt the operation of the time limit, (Gamaethige V. Siriwardene, 1988 (1) SLR384) is entitled to success.''

This application is dismissed with costs.

Application SC No. 129/98/(F/R) also stands dismissed but without costs.''

ඉහත සඳහන් 67/98(F/R) නඩුවේ හත්වැනි පිටුවේ දෙවන සහ තුන්වැනි ඡේදයේ පවසා ඇත්තේ පළමු පාර්ශ්වකරු අලුත් සේවකයෙක් බව තීන්දු කළ නිසා පළමු පාර්ශ්වකරුට තුන්වැනි ශ්‍රේණිය සහ දෙවැනි ශ්‍රේණිය සම්බන්ධව ඉල්ලුම්පත්‍රය ජයග්‍රහණය කිරීමට නොහැක.

තවද මෙම ඉල්ලුම්කරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(01) ඡේදය අනුව මෙම ඉල්ලුම්පත්‍රය කාල විරෝධී බවද පළමු පාර්ශ්වය මේ නඩුව 1997.11.06 වන දින සිට මාසයක කාලයක් ඇතුළත ඉදිරිපත් කර සිටිය යුතු ය. නමුත් පළමු පාර්ශ්වකරු පරිපාලනමය සහනයන් ප්‍රතික්ෂේප කළ නිසා ද ඉල්ලුම්පත්‍රය 1998.01.03 වන දින දාතම කරන ලද ඉල්ලුම්පත්‍රය 1998.02.03 වන දින ගොනු කල නිසාද මේ සම්බන්ධව පළමු පාර්ශ්වකරුට සහනයක් නැති බව පවසා ඇත. (ඉහත සඳහන් ඉංග්‍රීසි භාෂාවෙන් ඉතා පැහැදිලිව ඒ බව පවසා ඇත.)

කම්කරු කොමසාරිස් ජනරාල් මගින් සකස් කරන ලද 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 16 වගන්තිය යටතේ .... ඒ පාර්ශ්වය අතර ඇති ආරවුලට විෂය වී ඇතැයි කොමසාරිස්වරයාගේ දැනීමේ හැටියට ඔහු විසින් සලකනු ලබන එක් එක් කරුණ සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් පිළියෙළ කළ ප්‍රකාශය අනුව පෙනී යන්නේ S. C. Application No. 67/98(F/R) නඩු තීන්දුව කියවා නොමැති බවයි. නඩු තීන්දුවේ තේරුම් කර තිබුනේ නම් ඉදිරිපත් කර ඇති යොමුව වැරදි සහගත බව තේරුම් ගැනීමට ඉඩ තිබුණි. ඒ අනුව කටයුතු කර තිබුනේ නම් මේ අයුරින් යොමුවක් යොමු කිරීමට ඉඩ නොතිබුණි.

ඉහත සියලුම කරුණු සළකා බැලීමේදී පළමු පාර්ශ්වයේ පළවන සහ දෙවන ප්‍රකාශයද ලිඛිත දේශනයද ප්‍රතික්ෂේප කරන අතර මට පෙනී යන ආකාරයෙන් විසඳියයුතු යොමුවක් නොමැති බැවින් මෙම නඩුව ඉදිරියට ගෙන යාමට ඉඩ නැත. ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකරුගේ උපුටා ඇති පළමු හා දෙවැනි ප්‍රකාශ අනුව ඉතා හොඳින් පැහැදිලි වේ.

ඒ අනුව දෙවන පාර්ශ්වකරුවන්ගේ විරෝධතාවයන්ට ඉඩදිය යුතු අතර මෙම නඩුව මින් ඉදිරියට ගෙන යාමට සහ විසඳිය යුතු කරුණු නොමැති හෙයින් නඩුව අවසන් කරමි. ඒ අනුව ප්‍රදානයක් නොමැත.

එසේ හෙයින් මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව නිගමනය වේ.

ටී. එඩ්මන්ඩ් සාන්තරාජන්,
බේරුම්කරු.

2017 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

06 - 616

---

මගේ අංක : IR/10/49/2008

## කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.01.16 දිනැති හා අංක 1793/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.01.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කහදූව, තිබ්බොටුවාව, ''කෙත්සිරි'' හි පදිංචි එස්. විතානාච්චි මයා ඇතුලු සේවකයින් 47 දෙනා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍යය පාර, නො. 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.02.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් (වැඩ බලන).

2017 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/49/2008

කාර්මික අධිකරණයේ දී ය.

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එස්. විතානාච්චි මයා ඇතුලු සේවකයින් 47 දෙනා
''කෙත්සිරි'', තිබ්බොටුවාව, කහදූව

1. එස්. විතානාච්චි
2. පී. ඒ. ඩී. සරණපාල
3. ඩබ්. ඩී. ගුණරත්න
4. පී. ඩී. දයාසේන
5. ජී. මුනිදාස පීරිස්
6. එම්. ඒ. ප්‍රේමජයන්ත
7. එල්. කේ. පියසේන
8. පී. ඩී. එච්. රත්නසිරි
9. ඩබ්. ඒ. ජී. ප්‍රනාන්දු
10. එච්. ඒ. ජයතිරත්න
11. එස්. එම්. ඒ. ආනන්ද ප්‍රේමලාල්
12. ඊ. ඒ. සරත්
13. ඩී. අයි. මෙන්ඩිස්
14. එච්. ඩී. යසදාස
15. එච්. කුමාරදාස ද සිල්වා
16. එස්. ඩී. ලෙස්ලි
17. ඩබ්. එස්. එච්. ප්‍රනාන්දු
18. ජේ. එම්. ඩී. එස්. ඒ. ජයරත්න
19. එස්. ඩී. සුනිල්
20. ආර්. ඒ. සෝමවීර
21. වී. පී. කේ. රන්ජන් ශාන්ත
22. එච්. ජී. ඒ. ඉන්ද්‍රානන්ද
23. එච්. ඒ. විජේසේන
24. ඩබ්. ඒ. එස්. ජී. විජේසූරිය
25. එම්. එස්. ප්‍රනාන්දු
26. ඩී. පී. එල්. ඩබ්. බණ්ඩාර
27. යූ. ජී. එන්. එස්. පතිරණ
28. ජේ. එම්. ඩී. කිව්. ඇන්තනී
29. ඒ. ජී. එල්. පෙරේරා
30. බී. එම්. ලෙස්ලි ප්‍රේමලාල්
31. බී. ආර්. ද සිල්වා

32. පී. එම්. එල්. සිල්වා
33. පී. එච්. රත්නසිරි
34. ඒ. එල්. වික්‍රමාරච්චි
35. ඩී. එම්. ඒ. චන්ද්‍රතිලක
36. පී. නිමල් පෙරේරා
37. ඩබ්. ජී. ඥානදාස
38. ඩබ්. කේ. ඒ. ඒ. විජේසිංහ
39. වී. එන්. සොයිසා
40. ඊ. ඒ. නිහාල්
41. ඩබ්. ඩී. අයි. ප්‍රනාන්දු
42. එම්. රන්ජන්
43. එන්. කුමාරසිංහ
44. ඩී. එම්. ඒ. දිසානායක
45. ජී. ඩී. ජේ. සිල්වා
46. ජේ. පී. එස්. විජේසිංහ
47. ඩබ්. ඒ. ඩී. එස්. පුෂ්පකුමාර

නඩු අංකය : ඒ 3487 සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍යය පාර,
කොළඹ 01.

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහුට පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්ව අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2013.01.08 වන දින මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරවුල මෙසේය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශේෂ ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දෙඹකර ක්‍රියාකරු හෝ I වන ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දෙඹකර ලෙස පත්කිරීමේ දී එස්. විතානාච්චි මහතා ඇතුළු සේවකයින් හතළිස්හත් (47) දෙනා හට එකී තනතුරු නියමිත කාල වකවානු වලදී නොදීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී ද? එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔවුන්ට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

පළමු පාර්ශ්වය පළමු ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය ද ඊට පිළිතුරු ප්‍රකාශයක් ගොනු කරන ලදී. ඉන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රති උත්තරයක් ගොනු කර තිබිණි.

මෙම බේරුම්කරණයට ප්‍රථම A 3435 යටතේ මෙම ආරවුල යොමු කිරීමක් සිදුව තිබූ බව ද එම බේරුම්කාරතුමා මියයාමට හේතු කොට ගෙන නැවත ඉහත අංකය යටතේ යොමුකිරීමක් කර තිබූ බව පළමු පාර්ශ්වය බේරුම්කරණයට දැනුම් දෙන ලදී. මේ අනුව ප්‍රමාදය වැළැක්වීම සඳහා ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කිරීමට ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය ඊට එකඟතාවය පළ කරන ලදී.

ඒ අනුව සෝමදස විතානාච්චි සිය මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කළ අතර A1 සිට A10 දක්වා ලේඛන ලකුණු කර තිබිණි. ඉහත සාක්ෂිකරුගේ සාක්ෂියෙන් අනතුරුව ඉල්ලුම්කාර පක්ෂය හෙවත් පළමු පාර්ශ්වය සිය නඩුව අවසන් කොට නඩුව අවසානයේ දී ලිඛිත සැළකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී. A1 සිට A13 දක්වා ලේඛන ලකුණු කළ අතර මගේ කෙටි අත්සන සහිත එම ලේඛන බේරුම්කරණයට නඩුව අවසානයේදී භාර දීමට ද පළමු පාර්ශ්වය අපොහොසත් විය. A1 සිට A10 දක්වා ලේඛන දිවිරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර තිබිණි.

පළමු පාර්ශ්වය අවසන් කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය සිය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරමින් ටී. ආර්. ඩබ්. ඇලපාත වන මානව සම්පත් කළමනාකරු සාක්ෂියට කැඳවන ලදී. එම සාක්ෂිකරුගේ සාක්ෂිය අවසන් කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි මෙහෙයවීම අවසන් කරමින් R1 සිට (R33)හැර R35 දක්වා ලේඛන සමඟ ලිඛිත සැළකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

පළමු පාර්ශ්වය හෙවත් ඉල්ලුම්කාර පාර්ශ්වය බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් එස්. විතානාච්චි මයා ඇතුළු සේවකයින් දීර්ඝ කාලයක් වරාය අධිකාරිය යටතේ ට්‍රාන්ස්ෆර් දෙඹකර තනතුරේ II වන ශ්‍රේණියේ සේවය කර තිබූ බව ද එම තනතුරට අදළ උසස්වීම් නියමිත කාලය තුළදී නොලැබුණ බව ද ඒ අනුව තමන්ට අසාධාරණයක් සිදුව තිබූ බවද එසේ හෙයින් ට්‍රාන්ස්ෆර් දෙඹකර විශේෂ ශ්‍රේණියේ හෝ I ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දෙඹකර තනතුරු වල මෙම ඉල්ලීම කරන 47 දෙනා පිහිටුවන ලෙස සිය සාක්ෂි ඉදිරිපත් කරමින් ඉල්ලා තිබිණි. ඉල්ලුම්කාර පාර්ශ්වය තවදුරටත් සාක්ෂි ඉදිරිපත් කරමින් පසුව මෙම තනතුරට පත් වූ අය ඉහත උසස්වීම් ලබාගෙන තිබූ බවද ඒ අනුව මෙම සේවකයින් ට අසාධාරණයක් වූ බවටද කරුණු සඳහන් කර තිබිණි.

දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තර පාර්ශ්වය සිය කරුණු ඉදිරිපත් කරමින් මෙම සේවකයින් බඳවා ගැනීමෙන් අනතුරුව විධිමත් වැටුප් ව්‍යුහගත වීම් සිදුකර තිබෙන බවද එසේම සුදුසුකම් ලැබූ අය සම්මුඛ පරීක්ෂණයට කැඳවා උසස්වීම් ලබා දී තිබූ බවද ඒ අනුව ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් සිදු නොවූ බවද දෙවන පාර්ශ්වය විනිශ්චය සභාවට සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණි. එස්. විතානාච්චි මහතාට ඉහත පරිදි උසස්වීම් ලබා දී තිබූ බව ද විනයානුකූල හේතූන් මත දඩුවම් ලබා දී තිබෙන බව ද එම තත්වය උසස්වීම් ලබා දීමේ දී බලපාන බව ද දෙවන පාර්ශ්වය සිය සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත.

දෙවන පාර්ශ්වය මානව සම්පත් කළමනාකරු මඟින් බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් සේවකයන්ට අසාධාරණයක් සිදුනොවන පරිදි කටයුතු කළ බව සඳහන් කර තිබිණි. ඉල්ලුම්කරුවන්ට නිසි පරිදි උසස්වීම් නොලැබීමට හේතු කොට ගෙන කම්කරු කොමසාරිස් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු කොමසාරිස් දිසානායක මහතා විසින් පරීක්ෂණ සිදුකර තිබූ බව බේරුම්කරණයට A3 ලේඛනය ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාර පාර්ශ්වය සිය කරුණු ඉදිරිපත් කර තිබිණි. A3 ලේඛනය පරිදි ඉහත සාකච්ඡාව පවත්වා ඇත්තේ 2009.02.18 දින හෝ ඊට ආසන්න දිනයක බව ඉහත ලේඛනය අනුව අනාවරණය වේ.

වරායවල් පිළිබඳ අධිකාරී පනත අනුව සේවකයින්ට අදාළ නීති පැනවීමට බලය තිබෙන බවද ඒ අනුව කටයුතු කරමින් මෙම ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කළ බව ද ඊට අදාළ ලේඛන මත දීර්ඝ විස්තරයක් බේරුම්කරණයට මානව සම්පත් කළමනාකරු ඉදිරිපත් කරමින් කරුණු සඳහන්කර තිබිණි.

ඉහත ඉල්ලුම්කරුවන්ට වාර්ෂික වැටුප් වැඩිවීම් නිසි පරිදි ලබා දී තිබූ බව බේරුම්කරණයට දෙපාර්ශ්වය ඉදිරිපත් කළ සාක්ෂි අනුව පිළිගත හැකිය. 2005 වැටුප් හා ශ්‍රේණි විෂමතා කමිටුවේ නිර්දේශ සමාලෝචනය කිරීමේ කමිටු වාර්තාව 2006-R15 වශයෙන් දෙවන පාර්ශ්වය බේරුම්කරණයට ලකුණු කොට ඉදිරිපත් කර තිබිණි.

කම්කරු දෙපාර්තමේන්තුවේ සාකච්ඡාව දෙවන පාර්ශ්වය ප්‍රතික්ෂේප කොට නොතිබූ අතර ඔවුන් ද එම සාකච්ඡාවට සහභාගී වී තිබූ බව ද තහවුරු විය.

මානව සම්පත් කළමනාකරුගේ සාක්ෂිය අනුව ඔහු එම පරීක්ෂණයට සහභාගී වී තිබූ බව ද තහවුරු විය. එදින කාර්ය සටහනේ පිටපතක් දෙවන පාර්ශ්වය ලබා ගෙන නොතිබූ බව පිළිගත හැකිය. කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේ පරීක්ෂණය 2009.02.18 දින හෝ ඊට ආසන්න දිනයක දී සිදුකර තිබෙන බව ද ඒ අනුව පිළිගත හැක.

වරායවල් සම්බන්ධ අධිකාරී පනත යටතේ සේවකයින් සම්බන්ධ පත්වීම්, උසස්වීම්, වැටුප්, විනය පියවර ගැනීම, නිවාඩු, සේවා කාලය තීරණය කිරීම, ණය පහසුකම් සහ අත්තිකාරම් මුදල් යන ආදිය තීරණය කිරීමේ බලය ඉහත අධිකාරියට තිබෙන බව දෙවන පාර්ශ්වය R7(a) ලේඛනය ඉදිරිපත් කරමින් කරුණු සඳහන් කර තිබිණි. ඉල්ලුම්කාර පාර්ශ්වය එය ප්‍රතික්ෂේප කොට නොතිබුණි.

ඉල්ලුම්කාර පාර්ශවය ඉල්ලුම්කාර සේවකයින්ගේ සේවා කාලය පිළිබඳව තොරතුරු දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති A2 ලේඛනයේ සඳහන්ව ඇතත් පත්වීම් ලබාගත් දිනය එම ලේඛනයේ සඳහන්ව නොතිබිණි. A2 ලේඛනය පරිදි සියළුම සේවකයින්ගේ ට්‍රාන්ස්ෆර් දෙඹකරු II ශ්‍රේණයේ සේවකයින් බව අදාළ ලේඛනයේ සඳහන්ව ඇත. ඉල්ලුම්කාර පාර්ශ්වය ලේඛන ලකුණු කිරීමේදී A2 වශයෙන් ලේඛන දෙකක් ද ලකුණු කොට ඇති අතර එය නිවැරදි කිරීමක් කර තිබුණේද යන්න මාගේ කෙටි අත්සන සහිත ලේඛන ඉදිරිපත් නොවීම මත අනාවරණය වන්නේ ද නැත.

කම්කරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයට අදළ A3 දරන ලේඛනය මත පදනම්ව මෙම සේවකයින්ට වරදක් සිදු වී ඇති බව දෙවන පාර්ශ්වය පිළිගෙන තිබෙන බව ද එය නිවැරදි කිරීම සඳහා 2008.12.12 දින අයදුම්පත් කැඳවා ඇති බවත් එම ඉල්ලුම්පත් 2009.01.12 දින අවසන් වන බවද ඒ අනුව කටයුතු කරන බව කාර්මික සම්බන්ධතා අංශයට දැනුම් දී තිබෙන බව A3 ලේඛනයේ සඳහන් තොරතුරු අනුව පිළිගත හැකිය. 2009.06.01 දින සිට එම සියළු කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව සහනයක් නොලැබෙන අයට කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කරන ලෙස දැනුම් දී තිබෙන බව A3 ලේඛනයේ අවසන් ඡේදයේ සඳහන්ව ඇත.

ඉල්ලුම්කරුවන් ප්‍රකාශ කර තිබෙන්නේ තමන්ට සහනයක් නොලැබුණු බවත් ඒ අනුව නැවත කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණීමෙන් අනතුරුව එම ආරවුල බේරුම්කරණයට යොමු කර තිබූ බවය.

මෙම පරීක්ෂණයෙන් අනතුරුව දෙවන පාර්ශ්වය ගත් පියවර පිළිබඳව දීර්ඝ සාක්ෂියක් මානව සම්පත් කළමනාකරු බේරුම්කරණයට සිය ලේඛන ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණි. එකී ලේඛන කිසිවක් ඉල්ලුම්කාර පාර්ශ්වය අභියෝගයට ලක් කොට නොතිබුණි. ඉල්ලුම්කරුවන් අතරින් එස්. විතානාච්චි නැමැති සේවකයාව බඳවාගෙන ඇත්තේ තෝරා ගැනීමේ ශ්‍රේණියේ රියදුරු වශයෙන් බව ද පසුව ඔහුව 2006.01.01 දින සිට නව වැටුප් ව්‍යුහයක් යටතේ ට්‍රාන්ස්ෆර් දොඹකර II ශ්‍රේණියට පත් කොට තිබෙන බව R14 ලේඛනය අනුව අනාවරණය වේ.

ඉහත පත්වීමෙන් අනතුරුව මෙම සේවකයන්ගේ උසස්වීම් වලට අදාළව II ශ්‍රේණිය I ශ්‍රේණිය විශේෂ ශ්‍රේණිය වශයෙන් වර්ග කිරීමක් කර තිබෙන බව R15(a) ලේඛනය අනුව පිළිගත හැකිය. ශ්‍රේණි ක්‍රමයක් තොතිබීම මත දීර්ඝ කාලයක් එකම වැටුප් පරිමාණයක සිටීම හේතු කොට ගෙන ඉහත පරිදි නිර්දේශ කර තිබූ බව වගඋත්තරකරු R15(a) ලේඛනය මත කරුණු ඉදිරිපත්කර තිබිණ. ඉල්ලුම්කාර පාර්ශ්වය මෙය අභියෝගයට ලක් කොට නොතිබුණි.

I ශ්‍රේණිය II ශ්‍රේණිය සහ විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු වල සිටිය යුතු සේවක සංඛ්‍යාව පිළිබඳව ඉල්ලුම්කාර පාර්ශ්වය කිසිදු සාක්ෂියක් බේරුම්කරණයට ඉදිරිපත් කර නොතිබිණි. වග උත්තරකරු 3:2:1 අනුපාතයට සිදුකිරීමට කටයුතු කළ ද සේවක සංඛ්‍යාව අනුව එසේ කළ නොහැකි බවටද කරුණු ඉදිරිපත් කර තිබිණි. මෙම කරුණු අභියෝගයට ලක් කරමින් කරුණු ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කාර පාර්ශ්වය බේරුම්කරණයේ දී අපොහොසත් විය.

එස්. විතානාච්චි මහතා 1992.11.02 දින තෝරා ගැනීමේ ශ්‍රේණියේ රියදුරු තනතුරට පත්ව එම ශ්‍රේණියේම විධිමත් පත්වීමක් මත 1993.02.01 සිට ලබා දී තිබූ බව R8 හා R9 ලේඛන අනුව අනාවරනය වේ. ඉන් අනතුරුව 1998.01.01 දින සිට II ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර තනතුරට පත්ව තිබූ බව R10 ලේඛනය අනුව පිළිගත හැකිය. ඉහත තනතුරට පත්වීමෙන් අනතුරුව වාර්ෂික වැටුප් වර්ධක ලබාගනිමින් සේවය කර තිබූ බව ද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය. ඉල්ලුම්කරුට ඉන් අනතුරුව උසස්වීමක් ලබා දි ඇත්තේ I ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර තනතුරු බවද එය ලැබී ඇත්තේ 2009.11.30 දින සිට බව A9 ලේඛනය අනුව පිළිගත හැකිය. 1998.01.01 දින සිට II ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර තනතුරට පත්වීමෙන් අනතුරුව ඉහත පරිදි I ශ්‍රේණිය ලැබෙන තෙක් කිසිදු උසස්වීමක් ලැබී නොමැති බව ද පිළිගත හැකි ය.

ඉහත අධිකාරිය විටින් විට වැටුප් ප්‍රමාණයන් වැඩිකිරීම් සිදු කර තිබෙන බව ද ඒ අනුව වැටුප් වැඩිවීම් සිදු ව තිබෙන බව ද එසේම ඉහත වැටුප් වැඩිවීම් ඉල්ලුම්කරුවන් ඇතුළු සියලු සේවකයින් ට ලැබී තිබෙන බව ද බේරුම්කරණයට ඉදිරිපත් කළ සාක්ෂි අනුව පිළිගත හැකි ය.

I ශ්‍රේණියේ තනතුරු ලැබී ඇත්තේ ඉල්ලුම්පත් කැඳවීමකින් අනතුරුව බව A8 ලේඛනය අනුව පිළිගත හැකිය. ඊට අදාළ සුදුසුකම් මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මෙම පත්වීම ලබා දී තිබූ බව ඉල්ලුම්කාර පාර්ශ්වය ඉදිරිපත් කරන ලද A7, A8, A9 ලේඛන අනුව පිළිගත හැකිය.

එස්. විතානාච්චි නැමැති ඉල්ලුම්කරු 2002 අප්‍රේල් මස උසස්වීමක් ලබා ගැනීමට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව තිබූ බව ද අංක 15/2002 දරන චක්‍රලේඛය 2002.05.01 දින සිට ක්‍රියාත්මක වීම මත ඉහත තනතුර ලැබී නැති බව R6 ලේඛනය අනුව අනාවරණය වේ.

ඉහත කරුණු ඉල්ලුම්කරු වෙනුවෙන් අභියෝගයට ලක් කර නොතිබුණි. ඉහත R6 ලේඛනය ඉහත ඉල්ලුම්කරු කරන ලද පැමිණිල්ලක් මත කම්කරු කොමසාරිස්වරයා නිකුත් කර තිබෙන ලේඛනයක් බව ද අනාවරනය වේ.

ඉල්ලුම්කාර පාර්ශ්වය වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාර සේවකයින්ට වඩා අඩු සේවා කාලයක් තිබූ අයට ඉහත උසස්වීම් ලබා දීම තුලින් මෙම ඉල්ලුම්කරුවන්ට සාධාරණයක් සිදුව තිබූ බව සඳහන් කර තිබුණි. ඉහත කරුණ සම්බන්ධව ඉල්ලුම්කරුවන් නම් සඳහන් කරන ලද සේවකයින්ට අදාළ පත්වීම් ලිපි R28, R30, R32, වශයෙන් ලකුණු කොට අදාළ සේවකයින් ගේ පත්වීම් ලිපි බේරුම්කරණයට දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර තිබිණි. ටී. ඩබ්. වී. ජයතිලක ට්‍රාන්ස්ෆර් දොඹකර විශේෂ ශ්‍රේණියට 2007.03.28 දින සිට පත් කර තිබෙන බව R32 අනුව තහවුරු වේ. ආර්. එච්. ප්‍රියන්ත හා කේ. ආර්. සී. ෆොන්සේකා I ශ්‍රේණියේ රියදුරන් වන අතර ඔවුන් දෙදෙනා ද පත්ව ඇත්තේ 2007.03.28 දින සිට බව R28 හා R30 පත්වීම් ලිපි අනුව සනාථ විය.

ඉහත පත්වීම් තුලින් එස්. විතානාච්චි නැමැති ඉල්ලුම්කරුට හෝ වෙනත් ඉල්ලුම්කරුවෙකුට අසාධාරණයක් වූ බව කිසිදු සාක්ෂියක් මගින් ඉල්ලුම්කාර පාර්ශ්වය තහවුරු කිරීමට බේරුම්කරණයේ දී අපොහොසත් විය.

ඉහත සියලුම පත් කිරීම් දැන්වීමක් මත ඉල්ලුම්පත් කැඳවීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගෙන තිබෙන බව ද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකි ය.

එස්. විතානාච්චි හැරුන විට අනෙකුත් සේවකයින් පිළිබඳව නිවැරදි තොරතුරු බේරුම්කරණයට සාක්ෂි වශයෙන් ඉදිරිපත් නොවුණි. A2 ලේඛනය අනුව ඔවුන්ගේ සේවා කාලය පමණක් බේරුම්කරණයට දක්වා ඇතත් වෙනත් තොරතුරු කිසිවක් එම ඉල්ලුම්කරුවන්ට අදාළව බේරුම්කරණයට ඉදිරිපත් කිරීමට පළමු පාර්ශ්වය අපොහොසත් විය.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට තනතුරුවලින් උසස්වීම් ලබා ගැනීමට කාලයක් ගතව තිබූ බව පිළිගත හැකි වුවද එමගින් ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් සිදුව තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව වැඩි බර මගින් තහවුරුව නැති බව ඉදිරිපත් වූ සියලුම සාක්ෂි සැලකිල්ලට ගෙන මම නිගමනය කරමි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශේෂ ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර ක්‍රියාකරුවන් හෝ I ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර ක්‍රියාකරුවන් පත් කිරීමේදී මෙම ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් සිදුව තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත්වූ සාක්ෂි අනුව තහවුරුව නැති බව ඉදිරිපත් වූ සියලුම සාක්ෂි සැලකිල්ලට ගෙන මම නිගමනය කරමි.

ඒ අනුව ඉහත ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

නීතිඥ පාලිත වීරසේකර,
බේරුම්කරු.

2017 පෙබරවාරි මස 15 වැනි දින.

06 - 617

මගේ අංක : IR/10/51/2012

## කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.04.17 දිනැති හා අංක 1858/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, දම්පේ පල්ලිය වත්ත, නො. 162/1 හි පදිංචි එම්. එන්. ප්‍රනාන්දු මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, නො. 411 හි පිහිටි ලංකා විදුලි පුද්ගලික සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.01.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් (වැඩ බලන).

2017 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/10/51/2012

### කාර්මික අධිකරණයේ දී ය.

එම්. එන්. ප්‍රනාන්දු මයා,
නො. 162/1,
දම්පේ පල්ලිය වත්ත,
පිළියන්දල.

*ඉල්ලුම්කරු*

නඩු අංකය : ඒ 3551 සහ

ලංකා විදුලි පුද්ගලික සමාගම,
නො. 411,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ 03.

*වගඋත්තරකරු*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුල බේරුම් කිරීම මගින් සමථයකට පත් කිරීම සඳහා 2014.04.01 වන දිනැති නියෝගයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

ලංකා විදුලි පුද්ගලික සමාගමේ කාර්යාල කාර්ය සහායකයෙකු ලෙස සේවයට බඳවා ගෙන III වන ශ්‍රේණියේ විදුලි කාර්මික

තනතුර ලබා නොදී විදුලි කාර්මිකයෙකු ලෙස සේවයේ යෙදවීම නිසා එම්. එන්. ප්‍රනාන්දු මහතාට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ සිදු වූයේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

පැමිණිලිකාර පාර්ශ්වය වන එම්. එන්. ප්‍රනාන්දු මහතා වෙනුවෙන් නීතිඥ නලින් පෙරේරා මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර ආයතනය වන ලංකා විදුලි පුද්ගලික සමාගම වෙනුවෙන් පැට්‍රික් ගුණසේකර මහතා පැමිණ සිටියේ ය. එම පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ආදිල් කායිම් මහතා පෙනී සිටියේ ය.

දෙපාර්ශ්වයේ ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ හුවමාරු කර ගැනීමෙන් අනතුරුව ප්‍රථමයෙන් ඉල්ලුම්කරු නිරාජ් ප්‍රනාන්දු මහතා සිය කැමැත්තෙන් ම ඔහුගේ සාක්ෂිය දීම 2014.09.16 දින ආරම්භ කරන ලදී.

ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂියෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත.

ඔහු සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමෙන් පසුව 2008.11.24 දින සිට වගඋත්තරකාර ආයතනයේ සේවයට බඳවාගෙන ඇත. ඒ වන විට ඔහුගේ පියා මහබදුගේ ජෝන් බොස්කෝ ප්‍රනාන්දු ලංකා විදුලි පුද්ගලික සමාගමේ සභාපති ලෙස සේවය කරමින් සිටි චම්පානි පද්මසේකර මහතාගේ පුද්ගලික සේවකයෙකු වශයෙන් ඔහුගේ නිවසේ සේවය කරමින් සිට ඇති අතර සභාපතිගේ දැන්වීම මත ඔහු සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ඇත. එහෙත් ඊට සහභාගි වීමට ඉල්ලුම්පතක් ඉදිරිපත් කර නැතත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත්තේ තම පියා පෞද්ගලික සේවකයෙකු වශයෙන් එවකට සමාගමේ සභාපති චම්පානි පද්මසේකර මහතාගේ සහයෝගය මත බැව් සිතිය හැකිය. පත්වීම ලැබීමෙන් පසු ඉල්ලුම්කරු ඊ. එච්. කුරේ ගොඩනැගිල්ලේ පිහිටි ලංකා විදුලි පුද්ගලික සමාගමේ සේවය කළ බැව් ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂියෙන් පෙනී යයි. කුරේ ගොඩනැගිල්ලේ විදුලි පුද්ගලික සමාගමේ අභ්‍යන්තර විගණන අංශයේ ඉල්ලුම්කරු සේවය කර ඇත. (2014.09.16 දින 6 වෙනි පිටුව) එම අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා වූ යේ වේලුපිල්ලේ කන්දසාමි මහතාය. කන්දසාමි මහතා හමුවේ දී මෙසේ කියා ඇත. ''ඔහු මට වාඩි වෙන්න කියලා කරුණාසේන කියලා මහත්මයෙකුට කතා කරලා කිව්වා මාව විදුලි විමර්ශන කටයුතු සඳහා යොමු කරන්න කියලා (42 පිටුව)''

2008.11.24 දින පත්වීමේ ලිපිය ලැබුණාට පසු ඔහු සිදු කරන ලද සේවය පිළිබඳව මූලික සාක්ෂියේ දී බොහෝ කරුණු දක්වා ඇත.

''2008.11.24 දින සම්මුඛ පරීක්ෂණයට පැමිණි අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණයෙන් පසුව කිව්වා මෙම අවස්ථාවේ දී විදුලි කාර්මික III ශ්‍රේණියේ පත්වීම නොමැති බැවින් කාර්යාල කාර්ය සහායක තනතුරේ පුරප්පාඩු තිබෙනවා කියලා එම පත්වීම ලබා දීලා විදුලි කාර්මික III ශ්‍රේණියේ විදුලි කාර්මික ලෙස පත්වීමක් ලබාගෙන වැඩ කරගෙන යන්න කියලා වාචිකව කිව්වා. ඒ වාචිකව දෙන ලද පොරොන්දුව මත තමයි මම රාජකාරි කරගෙන ගියේ.'' (2015.01.26 දින 05 පිටුව)

පත්වීම කාර්යාල කාර්ය සහායක වුව ද ඔහු අවුරුදු 4 ට වැඩි කාලයක් ඉතා දක්ෂ ලෙස III ශ්‍රේණියේ කාර්මික තනතුරක අගනා සේවයක් ඉටු කර ඇත.

සවුදි අරාබියේ සමාගමක් විසින් ඉල්ලුම්කරුගේ දක්ෂතාවය සම්බන්ධයෙන් ඔහුට නිකුත් කරන ලද සහතිකයක් A3 සලකුණු කරන ලදී.

ඉල්ලුම්කරු ඔහුගේ මූලික සාක්ෂි විභාගයේ දී සාක්ෂි දෙමින් A5 සිට A10 දක්වා වූ ලේඛන කීපයක් ඉදිරිපත් කර ඇත. මෙම ලේඛන ඔහු ලබාගෙන ඇත්තේ අළුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයෙහි ලංකා පොලිසිය විසින් බොබේගාඩගේ මල්ලිකා ඇතුළු තවත් විදුලි පාරිභෝගිකයින් කීපදෙනෙකුට එරෙහිව පවරණ ලද නඩු කීපයක් සම්බන්ධයෙනි. විදුලි කාර්මික ලෙස චූදිත නම් කර ඇත. පළමුවන සාක්ෂිකරු ලෙස විමර්ශන නිලධාරී ඇස්. ලීලාරත්නගේ නම සඳහන් වේ. මෙම නඩුවල චූදිතයින්ට දඩ ගසා ඇති අතර ඉල්ලුම්කරුට විදුලි කාර්මික ලෙස පිළිගැනීමක් ලැබී ඇත.

2007.11.10 දිනැති ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් වන්නේ සුදුසු තනතුරක් සඳහා ඉල්ලුම් කර ඇති බවයි. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 28 ක් වයසැති සේවකයෙකි. ඔහුගේ මූලික සාක්ෂිය ඉදිරිපත් කිරීමෙන් පසු ඔහු බුද්ධිමත් තරුණයෙකු ලෙස ප්‍රශ්නවලටත් හරස් ප්‍රශ්නවලටත් පිළිතුරු දී ඇත.

ඒ වන විට ඔහුගේ පියා එවකට ලංකා විදුලි පුද්ගලික සමාගමේ සභාපති තනතුර දැරූ චම්පානි පද්මසේකර මහතාගේ පුද්ගලික සේවකයෙකු මෙන් සේවය කර ඇති අතර තම පුත්‍ර ඉල්ලුම්කරුට III ශ්‍රේණියේ විදුලි කාර්මික තනතුරක් ලබා ගැනීමට පද්මසේකර මහතාගේ උදව්වක් බලාපොරොත්තුවෙන් සිටි බවත් ඉල්ලුම්කරුගේ සහ වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිවලින් පෙනේ.

ඉල්ලුම්කරු සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් මීගමුවේ සිට ගාල්ල දක්වා මුහුදුබඩ තීරයේ විදුලි බෙදාහැරීම් සහ සැපයුම් කාර්යයේ නියැලී සිටින ශාඛා 4 කින් සමන්විත ඕනෑම ශාඛාවක සේවය කිරීමට කැමති III ශ්‍රේණියේ තනතුරට ඉල්ලුම්පත් කැඳවන ලදී. (R20)

එම දැන්වීම අනුව ඉල්ලුම්කරු සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වී ඇතත් ඉල්ලුම්පතක් ඉදිරිපත් කර නැත. ඉල්ලුම්කරුගේ පියා ඇම්. ජෝන් බොස්කෝ ප්‍රනාන්දු ''ලෙකෝ'' සමාගමේ සභාපති වශයෙන් සේවය කළ චම්පානි පද්මසේකර මහතාගේ නිවසේ පුද්ගලික සේවයක් කර ඇත. වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශනයෙහි මේ ගැන සඳහන් වේ. ඉල්ලුම්කරු ඔහුගේ 2008.11.24 දිනැති පත්වීමෙන් අනතුරුව ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි කන්දසාමි තාක්ෂණික කෙනෙකු ලෙස පත් කර ඇති බැව් වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි වලින් පැහැදිලි වේ. කළමනාකාර (පරීක්ෂක) කරුණාසේන මහතාට මේ සම්බන්ධයෙන් දැනුම් දීමෙන් පසුවද පරීක්ෂණ නිලධාරියාගේ තාක්ෂණිකයෙකු ලෙස පත් කරන ලදී. මින් පසු ඉල්ලුම්කරු Radio and Electronic Laboratory සෞදි අරාබියාවේ සේවය කළ කාලයේ තුළ දී නිවෙස්වල විදුලි උපකරණ නඩත්තුව සම්බන්ධයෙන් සුදුසුකම් ලබාගෙන තිබෙන බව ඔහුගේ සාක්ෂියෙන් සඳහන් කර ඇත. (A3) ඒ 5 සහ ඒ 10 ලේඛන ගොනු කර සාක්ෂි දෙමින් අනවසරයෙන් විදුලි බලය ලබා ගැනීම සම්බන්ධයෙන් උසාවියේ ගොනු කරන ලද නඩු කීපයක මුදල් ගෙවීමේ කුවිතාන්සි ඉදිරිපත් කර ඇත.

### වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ප්‍රථමයෙන් සාක්ෂි දෙන ලද්දේ විමර්ශන නිලධාරි සුදුහකුරුගේ ලීලාරත්න මහතාය. ඔහු

විමර්ශන අංශයට සම්බන්ධ වන විට අංශ ප්‍රධානියා වශයෙන් සේවය කළේ කරුණාසේන මහතාය. මෙම තනතුර ලැබීමට පෙර 1987 - 2011 දක්වා කාලය තුළ ඔහු සේවය කළේ නඩත්තු අංශයේ ය. 2011 නොවැම්බර් මාසයේ දී කරුණාසේන මහතා විසින් තිදෙනෙකුගෙන් යුත් ඉල්ලුම්කාර ඇම්. ඇන්. ප්‍රනාන්දු මහතා සේවකයින් තුන්දෙනෙකු හඳුන්වා දෙන ලදී. නිරාජ් ප්‍රනාන්දු මහතා හැර වෙනත් කාර්මික ශිල්පියෙකු කණ්ඩායමට ඇතුළත් නොවීය. R29 (I) සහ R29 (2) ලෙස වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් බේරුම්කරණයේ දී සළකුණු කරන ලද මේ ලිපි දෙක විමර්ශන නිලධාරි කරුණාසේන මහතා විසින් අත්සන් කර ඇත.

මේ අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වයේ ප්‍රධාන සාක්ෂිකරු ලීලාරත්න සාක්ෂියක් දීමට දිරිගත්තා සේ බව පෙනෙන්නට තිබුණි. ලීලාරත්න මහතා දුන් පහත සඳහන් පිළිතුරුවලින් වග උත්තරකාර පාර්ශ්වයේ ප්‍රධාන සාක්ෂිකරු දුර්වල තත්වයකට වැටී ඇත.

ප්‍ර. තමා පැවරූ වැඩ රාජකාරි ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කළා ද?

උ. නැහැ.

ප්‍ර. දූන් මහත්මයා තමා විමර්ශන නිලධාරියෙකු වශයෙන් තමා පැවරූ රාජකාරි ඔහු වුවමනාවෙන් ඉටු කළාද?

උ. ඔව්.

(2015.12.03 සාක්ෂි සටහනේ අංක 09 සිට 13 දක්වා පිටු)

පැමිණිල්ලේ නීතිඥවරයාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී ලීලාරත්න මහතාගේ සාක්ෂියෙන් ඉල්ලුම්කරුට වාසිදායක තත්වයක් උදාවී ඇත. වගඋත්තරකාර පාර්ශ්වය විසින් R29 (I) R29 (2) අදාළ විමර්ශන නිලධාරි කැඳවන්නේ නැතිව සලකුණු කළ ලීලාරත්න මහතා ඇත්ත ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කරු 2008.11.24 දින සිට 2012.01.09 දක්වා අවුරුදු 4 ට අධික කාලයක් තමන්ට සහතික තිබුණත් නැතත් ලංකා විදුලි පුද්ගලික සමාගම III වන ශ්‍රේණියේ විදුලි කාර්මිකයෙකුගේ සේවය ඉතා ඉහළ මට්ටමින් සිදු කරමින් සමාගමටත් ජනතාවටත් නිහතමානී සේවයක් කර ඇත. මේ කාලය තුළ ඔහුට ඉහළින් සේවය කළ කිසිම නිලධාරියෙකු ඉල්ලුම්කරුගේ සේවය ගැන කිසිම පැමිණිල්ලක් හෝ දෝෂයක් පෙන්වා නැත. තම හැකියාව සහ දැනුම යොදා ගනිමින් ඔහු වැදගත් සේවයක් සිදු කර ඇත.

2008.11.21 දින සිට 2012.01.09 දක්වා අවුරුදු 4ක අධික කාලයක් සේවය කර ඇතත් ඉල්ලුම්කරුගේ සේවය ගැන කිසිම ඉහළ නිලධාරියෙකු ඔහුට දොස් පවරා නැති අතර මේ කාලය තුළ ඔහු විශේෂ විමර්ශන අංශයේ විදුලි කාර්මිකයෙකු ලෙස සේවය කළ මුත් කිසිදු උසස් නිලධාරියෙකු ඔහුට කිසිම දෝෂාරෝපණයකට ලක් කර නැත. ඔහුගේ මේ නිහඬ සේවය යුක්තිය සහ සාධාරණය මත අගේ කළ යුතුයි.

2012.01.09 දිනැති ලිපිය මගින් මානව සම්පත් අංශ ප්‍රධානි විසින් රාජකාරි කටයුතු සඳහා ඔහු මොරටුව ශාඛා කාර්යාලයට ස්ථාන මාරු කර ඇත. (A13) මේ මාරු කිරීම ගැන ඉල්ලුම්කරුට කලින් දැන්වීමක් කර නැත.

පිළිගත් සම්ප්‍රදාය අනුව යම් පුද්ගලයෙකු ආයතනයක තනතුරක් සඳහා බඳවා ගැනීමේ දී ඔහුට වහාම රාජකාරි ලැයිස්තුවක් ද ලබා දිය යුතු ය. එහෙත් මෙම ස්ථාන මාරුවේ දී මේ සම්ප්‍රදාය උල්ලංඝනය වී ඇති බැව් පෙනේ. ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ පහත සඳහන් කොටස කෙරෙහි මගේ අවධානයට ලක් වී ඇත.

ප්‍ර. විමර්ශන කණ්ඩායමේ විදුලි කාර්මික ශිල්පියෙකු සිටිය යුතු ද?

උ. ඔව්.

ප්‍ර. තමාට පළමු වන දින භාර දුන් කණ්ඩායමේ නිරාජ් ප්‍රනාන්දු මහතා රාජකාරි නොකළා නම් එතැන විදුලි කාර්මික ශිල්පියෙකු සිටියාද?

උ. නැහැ.

ප්‍ර. තමාගේ ආයතනය තුළ විදුලි සහායක කියලා තනතුරක් තිබෙනවාද?

උ. නැහැ.

(2015.12.03 දින සාක්ෂි සටහනේ 3 වෙනි පිටුවේ ලීලාරත්න මහතාගේ සාක්ෂියෙන් උපුටනයකි.)

ප්‍ර. තමාට පළමු වන දින භාර දුන් කණ්ඩායමේ නිරාජ් ප්‍රනාන්දු මහතා රාජකාරි නොකළ නම් එතැන විදුලි කාර්මික ශිල්පියෙකු සිටිනවාද?

උ. නැහැ.

ඉහත සඳහන් ප්‍රශ්න හා උත්තර හමුවේ ඉල්ලුම්කරුගේ නිර්දෝෂීභාවය තහවුරු වී ඇත.

කම්කරු නීති ක්‍රියාත්මක කිරීමේ දී යුක්තිය සහ සාධාරණයට තැනක් හිමි වන බව පහත සඳහන් වැකියෙන් පැහැදිලිය.

''Industrial Court and Labour Tribunals are obliged in law to adopt the '' Just and equitable Concept in making their award Orders'' page 102 on Some thoughts on ''Just and equitable'' concept (Labour Tribunal Journal (2004) Vol. 1 part 6)

කම්කරු කොමසාරිස් 2014.03.17 දිනැති යොමුවේ සඳහන් වන පරිදි ලංකා විදුලි පුද්ගලික සමාගමේ කාර්යාල කාර්ය සහායකයකු ලෙස සේවයට බඳවාගෙන III ශ්‍රේණියේ විදුලි කාර්මික තනතුර ලබා නොදී විදුලි කාර්මිකයෙකු ලෙස සේවයේ යෙදවීම නිසා එම්. එන්. ප්‍රනාන්දු මහතාට යම් අසාධාරණයක් සිදු වූයේ ද? යන්න හා එසේ වූයේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න යොමුවේ සඳහන් වේ.

ලංකා විදුලි පුද්ගලික සමාගමේ කාර්යාල කාර්ය සහායක තනතුර සහ III ශ්‍රේණියේ විදුලි කාර්මික තනතුරු දෙක අතර මූල්‍යමය වෙනසක් නැත. එහෙත් මෙම නඩුවේ ඉල්ලුම්කරු සමාගමෙන් අතිරේක මූල්‍යමය සහනයක් නොලබා ඉතා දක්ෂ ලෙස අවුරුදු 4 ට වැඩි කාලයක් III ශ්‍රේණියේ විදුලි කාර්මික තනතුරේ සේවය කර ඇත. ඒ කාලය තුළ ඔහුගේ සේවය ගැන කිසිම ප්‍රශ්නයක් මතු වී නැත. අනෙකුත් සේවකයින් සමග සතුටින් හා සමාදානයෙන් ඔහු සේවය කර ඇත. එබැවින් 2008.11.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්. එන්. ප්‍රනාන්දු මහතා ලංකා විදුලි පුද්ගලික සමාගමේ III වන ශ්‍රේණියේ විදුලි කාර්මිකයෙකු ලෙස පෙරදාතම් කරන ලෙස ලංකා විදුලි පුද්ගලික සමාගමට නියෝග කරමි. මෙම නියෝගය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර මාස දෙකක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු ය.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2017 ජනවාරි මස 17 වැනි දින.

06 - 618

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.